# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2047/9 – 2017 නොවැම්බර් 27 වැනි සඳුදා – 2017.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ, උඩුවාවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒඑච්/එච්ආර්එස්/2016/434 හා 2017.04.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – උස්කැටේහේන – ප්‍රමාණය: හෙක්. 0.0815 ක් පමණ

උතුරට: මානෙල් ඊරියගම හිමිකම් කියන උස්කැටේහේන, ආනන්ද මනම්පේරි හිමිකම් කියන ගලහිටියාවවත්ත සහ අයි. ජී. ලීලාවතී හිමිකම් කියන ගලහිටියාවවත්ත; නැගෙනහිරට: අයි. ජී. ලීලාවතී හිමිකම් කියන ගලහිටියාවවත්ත සහ ඒ. රාජපක්ෂ හිමිකම් කියන උස්කැටේහේන; දකුණට: ඒ. රාජපක්ෂ හිමිකම් කියන උස්කැටේහේන සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ මානෙල් ඊරියගම හිමිකම් කියන උස්කැටේහේන.

ගයන්ත කරුණාතිලක,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/ඩබ්ලිව්එස්/131.<br>
2017 ඔක්තෝබර් මස 26 වැනි දින,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>
"මිහිකත මැදුර",<br>
අංක 1200/6, රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

12 - 340